වලුස් පැංචයි හාව පැංචයි

සඳේනි දෙනුවන්දි චන්ද්‍රසේකර

වලාස් පැංචයි හාන පැංචයි

සඳේනි දෙනුවන්දි චන්ද්‍රසේකර

වලස් පැංචයි හා පැංචයි

කතෘ ප්‍රකාශනයකි

සඳේනි දෙනුවන්දි චන්ද්‍රසේකර
2 ශ්‍රේණිය B
මහාමායා බාලිකා විදුහල
මහනුවර

ප්‍රථම මුද්‍රණය - 2025 ජනවාරි

ISBN 978 - 624 - 208 - 600 - 2

කතෘගේ වෙනත් කෘතීන්

පුංචි ලේන් පැටියා

ISBN 978 - 624 - 206 - 733 - 9

පිදුම



මාගේ ආදරණීය

අම්මාටත්, අප්පච්චීටත්,

විදුහල්පතිතුමිය, පන්තිභාර ගුරුතුමිය

ඇතුලු මාගේ පාසලේ සියලුම

ගුරු මහත්ම මහත්මීන්ටත්,

ආදරණීය සොයුරියන්ටත්

මෙම කෘතිය

හද බැතින් පුදමි.

පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝටිටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍ය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහහිත්‍ය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

.

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


එකෝමත් එක රටක
කැලෑවක වලස්
පැංචෙක් හිටියා.

දවසක් එයාට හරිම

බඩගිනියි. ඉතින් එයා

කෑම හොයා ගෙන

කැලේ ඇතුළට ගියා .



එයා පුංචි ගඟක් ළඟට ආවා. ගඟේ මාළුවෝ ඉන්නවාද කියලා බැලුවා. අනේ එක මාළුවෙක්වත් හිටියේ නෑ. මාළුවෝ වලස් පැංචා දැකලා ගල් අස්සේ හැංගිලා.

ඉතින් වලස් පැංචා
තව ටිකක් ඉස්සරහට
යනකොට
එයා ගහක
මී වදයක් තියෙනවා
දැක්කා.

වලස් පැංචා මී වදය

කඩන්න ගහ හෙලවුවා.

අනේ මී වදය ඇවිස්සිලා

වලස් පැංචට හොඳටම

මී මැස්සෝ විද්දා.

වලස් පැංචා අඬමින්

ඈතට දුවලා ගියා.



වලස් පැංචා අඬන
සද්දය හා පැංචෙකුට
ඇහුණා. යාළුවේ ඔයා
ඇයි අඬන්නේ
හා පැංචා ඇහුවා.

"මට බඩගිනියි " වලස්
පැංචා කිවුවා.
"අපේ ගෙදර පලතුරු
තියෙනවා. යමු අපේ
ගෙදර" හා පැංචා කිවුවා.



දෙන්නම හා පැංචාගේ
ගෙදර ගිහින් රසම රස
පලතුරු බඩ පිරෙන්න
කෑවා.


"ඔයාට බොහොම
ස්තුතියි" වලස් පැංචා
කිවුවා.
එදා ඉඳන් ඒ දෙන්නා
හොඳ යාළුවෝ වෙලා
ජීවත් වුනා.

පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණය කරන විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩ පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්